චක්‍රලේඛ අංකः - 94/20

මගේ අංකය:- අපේ/13/8 (1)
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,
"ඉසුරුපාය"
බත්තරමුල්ල.

1994 දෙසැම්බර් මස 13 දින

සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලුම කොට්ඨාශ භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

## විදුහල්පති ශ්‍රේණි වැටුපෙහි පිහිටුවීම නිසා සිදු වී ඇති වැටුප් අවාසිය නැති කිරීම

සියලුම උපාධිධාරී හා පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරීන් තම වැටුප් පරිමාණයන්හි වැටුප් වර්ධකයන් උපයාගෙන ඉහළ මාසික වැටුපක් ලබන බැවින්, ඔවුනට විදුහල්පති ශ්‍රේණිවල උසස්වීම් ලබා දුන්න ද, දනට තම අධ්‍යාපන සහතිකය අනුව ගනු ලබන වැටුප් පරිමාණයන් ඔවුනට පෞද්ගලික වශයෙන් ඒ ආකාරයෙන්ම ලබා ගැනීමට අවස්ථාව සලසා දීමට ආයතන අධ්‍යක්ෂගේ 1-543 ඊ 1 සී/3/94-3 ඒ. හා 1994.11.15 දිනැති ලිපියෙන් අනුමැතිය ලැබී ඇත.

02 මෙම වැටුප් අනුග්‍රහය ලබා දිය යුත්තේ සියලුම නිලධාරීන් සඳහා පොදුවේ පැවැත්වෙන බඳවා ගැනීමේ ක්‍රමයෙන් විදුහල්පති ශ්‍රේණි සඳහා තෝරා ගන්නා නිලධාරීන් සඳහා පමණකි. විදුහල්පති සේවයේ අදාළ ශ්‍රේණිවල පුරප්පාඩු නැති විටදී ද විධිමත් ක්‍රමයකින් තොරව පත් කරනු ලබන නිලධාරීන්ට මේ අනුග්‍රහය හිමි නොවිය යුතුය.

(සේනානායක උපසේන)
අතිරේක ලේකම්
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන ලේකම්
වෙනුවට.